## බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

# 2015 නොවැම්බර් මස 03 වන දින පෙ.ව.9.30ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. ගරු ජනක දීපාල් වැලිවත්ත මන්ත්‍රීතුමා විසින් ගරු ධීවර, මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවරධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2015.10.20 වන දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/VI (1) /15/37)

අ. හෝමාගම විවිධ සේවා සමුපකාර සමිතියේ කොමසාරිස්වරයාගේ බලතල මත පත් කළ සභාපතිවරයාගේ බලතල මත 2015-08-30,31 දිනයන්හිදී උකස් රන් භාණ්ඩ වෙන්දේසිය පැවැත්වූ බව ඔබතුමා දන්නෙහිද?

ආ. ඒ සදහා ඉදිරිපත් කළ රන් භාණ්ඩ ප්‍රමාණය කොපමණද?

ඇ. එම රන් භාණ්ඩ සදහා සමිතිය විසින් උකස්කරුවන්ට ලබා දී ඇති අත්තිකාරම් මුදල කොපමණද?

ඈ. එම රන් භාණ්ඩ සදහා අයවිය යුතු පොලී මුදල හා අනෙක් වියදම් මුදල කොපමණද?

ඉ. එහිදී රන් පවුමක් අලෙවිකර ඇති මිල කීයද?

ඊ. එම වෙන්දේසියේදී සමිතිය ලබා ඇති ශුද්ධ ලාභය හෝ පාඩුව කොපමණද?

උ. එම වෙන්දේසිය භාණ්ඩ වෙන් වෙන් වශයෙන්, තොග වශයෙන්, පවත්වන ලද වෙන්දේසියක්ද?

ඌ. ඒ සදහා කවුරුන් විසින් අනුමැතිය ලබා දී ඇත්ද?

02. ගරු ජනක දීපාල් වැලිවත්ත මන්ත්‍රීතුමා විසින් ගරු ධීවර, මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවරධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2015.10.20 වන දින අසන ලද ප්‍රශ්ණය:

(ප්‍ර/VI (1) /15/38)

අ. හෝමාගම විවිධ සේවා සමුපකාර සමිතිය විසින් 2014-09-05,06,07 දිනවල රන් භාණ්ඩ වෙන්දේසියක් පැවැත්වූ බව ඔබතුමා දන්නෙහිද?

ආ. ඒ සදහා ඉදිරිපත් කළ රන් භාණ්ඩ ප්‍රමාණය කොපමණද?

ඇ. එම රන් භාණ්ඩ සදහා සමිතිය විසින් උකස්කරුවන්ට ලබා දී ඇති අත්තිකාරම් මුදල කොපමණද?

ඈ. එම රන් භාණ්ඩ සදහා අයවිය යුතු පොලී මුදල හා අනෙක් වියදම් මුදල කොපමණද?

ඉ. එහිදී රන් පවුමක් අලෙවිකර ඇති මිල කීයද?

ඊ. එම වෙන්දේසියේදී සමිතිය ලබා ඇති ශුද්ධ ලාභය හෝ පාඩුව කොපමණද?

03. ගරු ජනක දීපාල් වැලිවත්ත මන්ත්‍රීතුමා විසින් ගරු ධීවර, මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවරධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2015.10.20 වන දින අසන ලද ප්‍රශ්ණය:

(ප්‍ර/VI (1) /15/39)

අ. 2014 / 2015 වර්ෂවලදී බස්නාහිර පළාත් සමුපකාර ග්‍රාමීය බැංකුවල හා දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්වල කොපමණ රන් භාණ්ඩ ප්‍රමාණයක් වෙන්දේසි කර ඇත්ද? ඒ කොපමණ ප්‍රමාණයක්ද?

ආ. එහිදී ඒ ඒ සමිති රන් පවුමක් අලෙවිකර ඇති මිල කීයද?

ඇ. එම කාලය තුළ කුමන සමුපකාර සංගම් ප්‍රමාණයක් තොග වශයෙන් අලෙවි කිරීම් කර ඇත්ද?

ඈ. එම රන් වෙන්දේසිවලදී ඒ ඒ සමිති ලබා ඇති ශුද්ධ ලාභය හෝ පාඩුව කොපමණද?

04. ගරු සලෝචන ගමගේ මන්ත්‍රීතුමා විසින් ගරු ධීවර, මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවරධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2015. 10. 20 වන දින අසන ලද ප්‍රශ්ණය:

(ප්‍ර/VI (1) /15/40)

අ. ග්‍රාමීය බැංකුවල ඇති රත්‍රං භාණ්ඩ වෙන්දේසි කිරීමේදී නියෝජිත ආයතයන ලෙස කටයුතු කරන්නේ කුමන ආයතනද?

ආ. ග්‍රාමීය බැංකු හා නියෝජිත ආයතන අතර ඇති බැදීම හා වගකීම කුමක්ද? (වෙන්දේසියක් වන අවස්ථාවේදී)

ඇ. ඒ සදහා බලපවත්වන නීති මාලාව කුමක්ද?

ඈ. රත්‍රං භාණ්ඩ වෙන්දේසි සදහා ඉදිරිපත් කළ පසු එහි අවසානාත්මක තීරණ බලය ඇත්තේ කාටද?

05. ගරු සලෝචන ගමගේ මන්ත්‍රීතුමා විසින් ගරු ධීවර, මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2015.10.20 වන දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/VI (1) /15/41)

අ. දැනට සමුපකාර දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරන සමුපකාර ග්‍රාමීය බැංකු කාර්ය රීති සංග්‍රහය බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කර ඇති නීත්‍යානුකූල ලියවිල්ලක්ද?

ආ. එය අනුමත කර ඇත්තේ කවුද? කවදාද?

ඇ. ඉහත කී රීති සංග්‍රහය බස්නාහිර පළාතේ සමුපකාර දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද දැනට භාවිතයට යොදා ගන්නා ග්‍රාමීය බැංකු කාර්ය රීති සංග්‍රහයද?

ඈ. බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 3 දරන සමුපකාර ප්‍රඥප්තියේ 61 වගන්තියේ 03 වන උපශීර්ෂයෙහි සඳහන් වන බලය මත ඉහත කී ග්‍රාමීය බැංකු කාර්ය රීති සංග්‍රහය පිළියෙළ කර තිබෙන්නේද?

ඉ. ඉහත කී කාර්ය රීති සංග්‍රහය රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර තිබේද?

ඊ. බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 4 දරන සමුපකාර ප්‍රඥප්තියේ අංක 36(3) යටතේ වන ඉහත කී ග්‍රාමීය බැංකු කාර්ය සංග්‍රහය අනුමත වන්නේද? ඒ කවදාද?

උ. ඒ යටතේ දඩුවම් කිරීම සඳහා මෙම කාර්ය රීති සංග්‍රහය ඔබතුමා විසින් උපයෝගී කර ගැනීම නිසා, මෙතෙක් ඔබතුමා සිදු කරන ලද කාර්යයන් බල රහිත හා නිෂ්ක්‍රීය වන බව පිළිගන්නවාද?

06. ගරු මහේෂ් අල්මේදා මන්ත්‍රීතුමා විසින් ගරු ධීවර, මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවරධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2015.10.20 වන දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/VI (1) /15/43)

අ. බස්නාහිර පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය යටතේ මාර්ග පරීක්ෂක වරුන් කොපමණ සංඛ්‍යාවක් සේවයේ යෙදී සිටිනවාද?

ආ. එම නිලධාරීන්හට තිබෙන රාජකාරිය හා වගකීම කුමක්ද?

ඇ. මෙම නිලධාරීන් විසින් දිනකට කොපමණ බස්රථ සංඛ්‍යාවක් පරීක්ෂාවට ලක් කරන්නේද?

ඈ. ගෙවුනු සතිය තුල වාර්තා වී ඇති බ.ප. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය යටතේ ධාවනය වන බස් රථ සම්බන්ධව සිදු වූ අනතුරු සංඛ්‍යාව කොපමණද?

ඉ. එම අනතුරු සම්බන්ධයෙන් ගෙන ඇති නිතිමය පියවර මොනවාද?

ඊ. විධිමත් රියදුරු බලපත්‍රයක් නොමැතිව බස් රථ ධාවනයේ යෙදුණු රියදුරන් කොපමණ සංඛ්‍යාවක් මෙම කාලය තුල වාර්තා වී තිබේද?

උ. එසේ වාර්තා වී ඇති රියදුරන් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?

ඌ. එම ගන්නා වූ ක්‍රියාමාර්ග පිළිබඳව මෙම ගරු සභාව දැනුවත් කරන්නේද?

එ. නොඑසේනම් ඒ මන්ද?

**07.** ගරු මංජු ශ්‍රී අරංගල විපක්ෂ නායකතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිලිබඳ අමාත්‍යතුමාගෙන් 2015.10.20 දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/VI (1) /15/44)

අ. බ/ප/කො/ ගුණසිංහ විද්‍යාලයේ ඉදිකිරීම් හා අලුත්වැඩියාවල කොන්ත්‍රාත්කරුවෙකු ලෙස හංවැල්ල ආවිගල අංක 64 ලිපිනයේ V.D.T. අරුණ කුමාර මහතා කටයුතු කර ඇති බව ඔබතුමා දන්නේද?

ආ. ඔහු 2014 එම විද්‍යාලයේ පළමු වසර පන්ති කාමර රු150000/- ක හා කාර්යාල ගොඩනැගිල්ල ලක්ෂ 5 ක වියදමින් අලුත්වැඩියා කිරීම කළ බව පිළිගන්නේද?

ඇ. එම ඉදිකිරීම් කොළඹ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ හා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවන්ගේ අධීක්ෂණයට ලක්ව ගෙවීම් අනුමත කර ඇතිබව දන්නේද?

ඈ. එකී ගෙවීම් සඳහා පාසැල් සංවර්ධන සමිතිය වෙත එම කොන්ත්‍රාත් සඳහා වූ මුදල් බැර කර ඇති බව දන්නේද?

ඉ. එකී මුදල් ලබා දී තිබියදී රු346,668/-ක මුදලක් හා රැඳවුම් මුදල් වන රු65000/- ක මුදලක් කොන්ත්‍රාත්කරු අරුණ කුමාර මහතා වෙත නොගෙවා ඇති බව දන්නේද

ඊ. මෙම ඉදිකිරීම්වල අනුමත මුදලින් 5% කොමිස් මුදලක් පාසැල් සංවර්ධන සමිතිය වෙත කොන්ත්‍රාත්කරු ගෙවා ඇති බව දන්නේද?

උ. මෙම කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට පාසැල් සංවර්ධන සමිතිය වෙත ලබා දී ඇති මුදල් ඔහුට ගෙවීමට කටයුතු කරන්නේද?

ඌ. මෙසේ නීත්‍යානුකූල ගෙවීම් පැහැර හැර ඇති විදුහල්පති ඇතුළු වගකිවයුතු අය පිළිබද ගන්නා ක්‍රියා මර්ග කවරේද?

**08.** ගරු හරිශ්චන්ද්‍ර ද කොස්තා මන්ත්‍රිතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබද අමාත්‍යතුමාගෙන් ඇසිමට:

(ප්‍ර/VI (1) /15/46)

අ. කැස්බෑව නගර සභා බල ප්‍රදේශයට අයත් පැලැන්වත්ත "හේනකම්බිලදෙනිය" වෙල්යායේ ගොවිජන සේවා කාර්යාලයෙන් 1978 කාල වකවානුවේ ඉදිකළ පිටවේල්ල සහ ස්වාභාවික වැසි ජලය බැස යාමට තිබුණු බෝක්කුව ගල් රෝල දමා යට කර තාර දමා මෙම ප්‍රදේශයේ ඇති පහත් බිම් අක්කර 06කට වඩා වැඩි ප්‍රමාණයක් අනුමැතියෙන් තොරව ගොඩ ඉඩම් බවට උපක්‍රමශිලිව පරිවර්තනය කර එහි අනවසර ඉදිකිරීම් කිරීමට කටයුතු කරන බව ඔබතුමා දන්නවාද?

ආ. කැස්බෑව නගර සභාවේ සැලසුම් අංශයේ තාක්ෂණ නිලධාරින් විසින් මෙම ප්‍රදේශයේ පහත්බිම් ප්‍රදේශවල හා වසර 10-15 වඩා පැරණි දෙමහල් තෙමහල් ගොඩනැගිලිවල වංචනික අයුරින් නව සැලසුම් අනුමතකර දී කැස්බෑව නගර සභාවට අයවිය යුතු ඇ මුදල් විශාල ප්‍රමාණයක් සභාවට නොලැබී යන අයුරින් කටයුතු කර ඇති බව ඔබ තුමා දන්නවාද?

ඇ. මේ නිසා සිදු වන පාරිසරික හානි සොබා අවදානම යන තත්වයන් පිළිබදව හා සිදුව ඇති වංචනික ක්‍රියා පිළිබදව නිසි පරීක්ෂණයක් පවත්වන්නේද?

ඈ. නොඑසේනම් ඒ මන්ද?

09. ගරු කිත්සිරි කහටපිටිය මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) /15/47)

අ. ඔබ අමාත්‍යාංශයේ 2015 වර්ෂය තුළ පුරප්පාඩුව පවතින රැකියා ප්‍රමාණය කොපමණද?

ආ. එම පුරප්පාඩු සඳහා 2015 වර්ෂය තුළ බඳවා ගැනීමට සැලසුම් කර තිබේද?

ඇ. 2015 වර්ෂය තුළ බඳවා ගැනීමට සැලසුම් කර තිබෙන පුරප්පාඩු වෙන වෙනම දක්වන්නේ නම් ඒ මොනවාද?

ඈ. එසේ පුරප්පාඩුව පවතින රැකියාවන්ට අදාළව බඳවා ගැනීමේදී යෝජනාකර ඇති අවම අධ්‍යාපන සුදුසු කම කුමක්ද?

ඉ. එම පුරප්පාඩු පිරවීමේදී උපයෝගී කර ගන්නා ක්‍රම වේදයන් මොනවාද?

10. ගරු කිත්සිරි කහටපිටිය මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) /15/48)

අ. ඔබ අමාත්‍යාංශයේ 2015 වර්ෂය තුළ පුරප්පාඩුව පවතින රැකියා ප්‍රමාණය කොපමණද?

ආ. එම පුරප්පාඩු සඳහා 2015 වර්ෂය තුළ බඳවා ගැනීමට සැලසුම් කර තිබේද?

ඇ. 2015 වර්ෂය තුළ බඳවා ගැනීමට සැලසුම් කර තිබෙන පුරප්පාඩු වෙන වෙනම දක්වන්නේ නම් ඒ මොනවාද?

ඈ. එසේ පුරප්පාඩුව පවතින රැකියාවන්ට අදාළව බඳවා ගැනීමේදී යෝජනාකර ඇති අවම අධ්‍යාපන සුදුසු කම කුමක්ද?

ඉ. එම පුරප්පාඩු පිරවීමේදී උපයෝගී කර ගන්නා ක්‍රම වේදයන් මොනවාද?

11. ගරු කිත්සිරි කහටපිටිය මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යොවුන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට;

(ප්‍ර/VI (1) /15/49)

අ. ඔබ අමාත්‍යාංශයේ 2015 වර්ෂය තුළ පුරප්පාඩුව පවතින රැකියා ප්‍රමාණය කොපමණද?

ආ. එම පුරප්පාඩු සඳහා 2015 වර්ෂය තුළ බඳවා ගැනීමට සැලසුම් කර තිබේද?

ඇ. 2015 වර්ෂය තුළ බඳවා ගැනීමට සැලසුම් කර තිබෙන පුරප්පාඩු වෙන වෙනම දක්වන්නේ නම් ඒ මොනවාද?

ඈ. එසේ පුරප්පාඩුව පවතින රැකියාවන්ට අදාළව බඳවා ගැනීමේදී යෝජනාකර ඇති අවම අධ්‍යාපන සුදුසු කම කුමක්ද?

ඉ. එම පුරප්පාඩු පිරවීමේදී උපයෝගී කර ගන්නා ක්‍රම වේදයන් මොනවාද?

12. ගරු ලක්ෂමන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ධීවර, මාර්ග ප්‍රවාහන, සමුපකාර සංවරධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවරධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) /15/50)

අ. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ නව කාර්යාලය පිටුපස ඉඩම මිල දී ගැනීම මගින් අක්‍රමිකතාවයක් සිදුවී ඇති බව පිළිගන්නේ ද?

ආ. ඉඩම මිලදී ගත් දිනය,වටිනාකම,ඉඩමේ ප්‍රමාණය,ඉඩමට පිවිසුම් මාර්ගයක් තිබේද? තිබේ නම් එහි පළල කොපමණ ද? යන්න සදහන් කරන්නේ ද?

ඇ. ඉඩම මිළදී ගැනීමට ගත් ණය මුදල් සදහා මෙතෙක් ගෙවා ඇති හා ගෙවා අවසන් නොකළ හිඟ මුදල කීයද?

ඈ. ඉඩම මිළදී ගැනීමට හේතු වූ අපේක්ෂිත කාර්යයන් මේ වන විට ඉටු වී තිබේද?

ඉ. නොඑසේ නම්, ඒ මන්ද?

13. ගරු ලක්ෂමන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ධීවර, මාර්ග ප්‍රවාහන, සමුපකාර සංවරධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවරධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) /15/51)

අ. හෝමාගම නව බස් නැවතුම් පොළ ඉදි කිරීම සදහා වැය කර ඇති මුළු මුදල කොපමණද?

ආ. I. ඉදි කිරීම ආරම්භ කළ දිනය කවදාද?

II. ඉදි කිරීම අවසන් කළ දිනය කවදාද?

ඇ. එය මේ වන තෙක් විධිමත් බස නැවතුම් පොළක් ලෙස යොදා නොගන්නේ මන්ද?

ඈ. බස් නැවතුම් පොළ ඉදිකිරීම මගින් අපේක්‍ෂා කළ අරමුණු ඉටු නොවීම හා අපේක්‍ෂා කළ වියදමට වඩා වැඩියෙන් මුදල් වැය කිරීම නිසා ඇති වී තිබෙන පාඩුව කොපමණද?

ඉ. පාඩුවක් සිදු වී තිබේ නම්, එයට වගකිව යුත්තේ කවුරුන්ද?

ඊ. වගකිව යුත්තන් පිළිබදව ගන්නා හෝ ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද?

උ. නොඑසේ නම්, ඒ මන්ද?

14. ගරු ලක්ෂමන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ධීවර, මාර්ග ප්‍රවාහන, සමුපකාර සංවරධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවරධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) /15/52)

අ. ටෙන්ඩර් කිරීමකින් තොරව බස් රථ සදහා නොමිලේ බලපත්‍ර නිකුත් කරන ක්‍රමවේදයන් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය යටතේ තිබේද?

ආ. I. ක්‍රමවේදයකට අනුව හෝ නොමැතිව නොමිලේ බලපත්‍ර නිකුත් කර තිබේද?

II. කුමන බස් රථ සදහාද, ඒවායේ අයිතිකරුවන් කවුරුන්ද?

ඇ. එසේ බස් රථ සදහා නොමිලේ බලපත්‍ර දීමෙන් අහිමි වී ඇති ආදායම කොතෙක්ද?

ඈ. සිදු වී ඇති පාඩුවට වගකිව යුතු වගකිවයුත්තන් කවුරුන්ද?

ඉ. වගකිවයුත්තන් පිළිබදව ගන්නා හෝ ගෙන ඇති ක්‍රියා මාර්ගයන් කවරේද?

ඊ. නොඑසේ නම්, ඒ මන්ද?

15. ගරු යු. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ආ/VI (1) /15/53)

අ. කැලණිය අධ්‍යාපන කලාපයේ කැලණිය අධ්‍යාපන කොට්ඨාශයේ පාසැල්වල විදුහල්පති විභාගය සමත් විදුහල්පති ශ්‍රේණියේ සිටින ගුරුවර / ගුරුවරියන් කීදෙනෙකු සේවයේ යෙදෙන්නේද?

ආ. ඔවුන්ගේ නම් වශයෙන් සඳහන් කරන්නේද?

ඇ. එම ගුරු භවතුන් කැලණිය කොට්ඨාශයේ පාසැල්වල විදුහල්පති තනතුරු දරයිද?

ඈ. එසේ නම් එම විද්‍යාල හා විදුහල්පතිවරුන්ගේ නම් සඳහන් කරන්නේද?

ඉ. කැලණිය අධ්‍යාපන කොට්ඨාශයේ විදුහල්පති ශ්‍රේණි නොමැති අධ්‍යාපන පරිපාලන විභාග සමත් අය විදුහල්පති තනතුරු දරයිද?

ඊ. ඒ විදුහල්පතිවරුන්ගේ නම් හා පාසැල් නම් කල හැකිද?

උ. එසේ නම් එම අය දැනට අධ්‍යාපන අධ්‍යක්ෂක තනතුරු සඳහා පත් නොකරන්නේ මන්ද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම

## IX. සභාවේ රැස්වීම් I.

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

යෝජනාව:

මින් පෙර කිනම් තීරණයකට එළඹුණද, ඒ කිසිත් නොතකා, 2015.10.21 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එකඟතාවය පළකළ පරිදි 2015.11.17 දින විසිර යෑමෙන් අනතුරුව, මෙම පළාත් සභාව 2015.11.24 දින පෙ.ව 9.30ට රැස්විය යුතු අතර, එකී 2015.11.24 දිනය '2016 වර්ෂයේ මුදල් ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා වෙන්කළ දිනය' වශයෙන් සළකා ක්‍රියා කළ යුතුය.

## සභාවේ රැස්වීම් II

ගරු සභා කටයුතු පිළිබඳ විෂයභාර අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට :

යෝජනාව:

"2016 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය සහ ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන් සම්බන්ධයෙන්, මින් පෙර කිනම් තීරණයක් ගෙන තිබුණද, ඒ කිසිත් නොතකා, 2015.10.21 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එළඹුණු එකඟතාවයද සැලකිල්ලට ගෙන, 2015 දෙසැම්බර් මස 15,16,17,18,21 හා 22 යන දිනයන් "2016 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය සහ ඒ හා සම්බන්ධ වැඩ කටයුතු" සඳහා වෙන් කළ දිනයන් විය යුතු යැයි සළකා ක්‍රියා කළ යුතුය."

## සභාවේ රැස්වීම් III

ගරු සභා කටයුතු පිළිබඳ විෂයභාර අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට :

යෝජනාව:

2015 -10- 21 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී, එළඹුණු එකඟතාවය පරිදි, 2015 දෙසැම්බර් මස 08,09,10,11 හා 14 යන දිනයන් සභා රැස්වීම් නොපැවැත්වෙන දිනයන් ලෙස සලකා ක්‍රියා කළ යුතුය.

## X. සභාවේ කටයුතු

ගරු සභා කටයුතු පිළිබඳ විෂයභාර අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට :

යෝජනාව:

"අද දිනට නියමිත න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයය යටතේ දැක්වෙන වැඩ කටයුතු කාර්ය පටිපාටි රීති අංක 52 (5), 57 (4) හා 57 (5) හි දැක්වෙන විධිවිධානයන්ගෙන් නිදහස්ව පවත්වා ගෙන යා යුතුය"

## XI. පොදු කටයුතු

01. ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප):

යෝජනාව: <u>2015 පරිපූරක ඇස්තමේන්තුව - 01</u>

'බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, කාර්යාල, පළාත් පාලන ආයතන හා ව්‍යවස්ථාපිත ආයතන සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 24/2014, 24/2014(1) හා 05/2015 මගින් වැඩි කරන ලද අන්තර් දීමනා ගෙවීම හා අවශ්‍යයෙන්ම ගෙවිය යුතු වැටුප්, ගුරු හිඟ වැටුප් හා දීමනා ගෙවීමට අවශ්‍ය අමතර ප්‍රතිපාදන සලසා දීමද,

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරුවරුන්ගේ / නිලධාරීනගේ දේපළ ණය පොළී ගෙවීම සඳහා අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන සැලසීම යන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අතිරේක පුනරාවර්තන ප්‍රතිපාදන සැලසීමද,

අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍ර වෙනුවෙන් 2014 වර්ෂයේදී ලෝක බැංකු ආධාර යටතේ ලබාදෙන ලද මුදලින් වියදම් නොවී ඉතිරි වූ මුදල් එම ක්ෂේත්‍රවල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා යෙදවීමට අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමද, හා

තැපැල් හා උසාවි කටයුතු හැරුණ විට ඇති ගිවිසුම් ගාස්තු ඇතුළු මුද්දර ගාස්තු ආදායම රුපියල් මිලියන 500කින් ඉහළ නැංවීම සඳහා වූ ආදායම් ඇස්තමේන්තු සංශෝධනය හා එම මුදල් පළාත් පාලන ආයතන වෙත ගෙවීම වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමද යන අවශ්‍යතා වෙනුවෙන්,

2015 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතුව ඇති හෙයින්,ඒ සඳහා රජයේ ප්‍රදාන රුපියල් 7,799,160,000/- ක්, 2014 වර්ෂයේදී ලෝක බැංකු ආධාර යටතේ ලබාදෙන ලද මුදලින් වියදම් නොවී ඉතිරි වූ මුදල් රුපියල් 77,610,000/- ක්, හා පළාත් සභා ආදායමින් රුපියල් 500,000,000/- ක්, යනාදි වශයෙන් වූ මුළු ප්‍රතිපාදනය රුපියල් අටසිය තිස්හත් කෝටි හැට හත් ලක්ෂ හැත්තෑ දහසක් (රු 8,376,770,000/-) වන පරිදි පිළියෙල කරන ලද <u>2015 පරිපූරක ඇස්තමේන්තුව - 01</u> අනුමත කළ යුතුය.'

02. ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප):

යෝජනාව: <u>2015 පරිපූරක ඇස්තමේන්තුව - 01ට අදාළ විසර්ජන ප්‍රඥප්තිය</u>

'2015 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තුව -01 සඳහා අවශ්‍ය රුපියල් අටසිය තිස්හත් කෝටි හැට හත් ලක්ෂ හැත්තෑ දහසක් (රු 8,376,770,000/-) වූ මුදල බස්නාහිර පළාත් සභා අරමුදලින් ගෙවීමටත්, එකී බස්නාහිර පළාත් සභා අරමුදලට, ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ප්‍රදාන වශයෙන් හෝ වෙනත් ආකාරයකින් ලැබෙන මුදල් භාරගැනීමටත් බලය දෙනු ලබන 2015 අංක ... දරන විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය.'

## XII. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

### 01. ගරු කේ. ඩී. අරුණ දිපාල් මන්ත්‍රිතුමා:

'පළාත් සභා වෙත පවරන ලැබ ඇති විෂයයන්ට අදාළව පළාත් සභා විසින් මේ වන විට ප්‍රඥප්ති සැහෙන සංඛ්‍යාවක් සම්මත කර ක්‍රියාත්මක කරනු ලැබුවද,එම ප්‍රඥප්තින් පිළිබදව වෘත්තිකයන් මෙන්ම මහජනතාව තුළද පවත්නා දැනුවත්භාවය ඉතා අවම මට්ටමක පවතී. සම්මත කරනු ලැබ ඇති ප්‍රඥප්ති මහජනතාව අතර සංසරණය නොවීම රට එක් ප්‍රධාන හේතුවක් වන බව පෙනී යන කරුණකි.

එබැවින් බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් සම්මත කරනු ලැබ ඇති සියලුම ප්‍රඥප්ති මුද්‍රණය කර මහජනතාවට මිළදී ගැනීමට අවස්ථාව සලසා දිය යුතු යැයිද, එම ප්‍රඥප්ති සහ පළාත් සභාව මගින් ප්‍රකාශයට පත් කරනු ලබන සෙසු පොදු ලේඛණ මහජනතාවට මිලදී ගැනිම සදහා වෙනම ම අලෙවි මධ්‍යස්ථානයක් ස්ථාපනය කළ යුතු යැයිද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි.'

(යෝ/VI (1) /14/ 12)


### 02. ගරු ඉන්දික බණ්ඩාර මන්ත්‍රිතුමා :

'බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුල රණවිරු ගම්මාන කිහිපයක්ම පිහිටුවා ඇති අතර, මෙම ගම්මානවල ජිවත් වන්නේ 30 වසරක් අප රට තුළ පැවති යුද්ධයෙන් අප මව්බිම මුදාගැනිම සදහා තම ජිවිත පරිත්‍යාග කළ යුද්ධය නිසා ආබාධිත වූ රණවිරුවන් සහ ඔවුන්ගේ මවුපියන්, අඹුදරුවන්ය.

මැතිවරණ කාල සිමාවන් තුලදී සියලූ දේශපාලන පක්ෂ නියෝජිතයින් රණවිරු ගම්මාන වලට ගොස් ඡන්දය ලබා ගත්තද, එම ගම්මානවල වැසියන් ප්‍රවාහන, සෞඛ්‍ය, අධ්‍යාපන, පානිය ජලය නොමැතිකම වැනි ප්‍රශ්න රාශියකින් පිඩා විදිති. අප රට වෙනුවෙන් විශාල කැපවීමක් සිදුකළ රණවිරු ගම්මානවල වෙසෙන ජනතාවගේ ඉහත සදහන් අවශ්‍යතාවන් ඇතුලූ ගැටලූ සොයා බලා ඒ සදහා පිළියම් ලෙස රණවිරු ගම්මාන වැසියන්ගේ ජිවන තත්වය ඉහළ නැංවීම සදහා ක්‍රමවත් වැඩපිළිවලක් සකස් කළ යුතු යැයිද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි.'

(යෝ /VI (1) /14/13)

## XIII. සභාව කල් තැබීම



කේ,එච්.ඩී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2015.10.21 දින ,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.